ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022-06-07

පැමිණිලිකාර පාර්ශවය : කේ.ජ්.තෙරේසා කුරේ මිය,
නො. 72/1, වැලිඹිවිට කන්ද,
වැලිකන්න,
වග.

වගඋත්තර පාර්ශවය : 01. ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

02. පළාත් ඉඩම් කොමසාරිස්,(බස්නාහිර පළාත),
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10.

03. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
(සීතාවක) හංවැල්ල.

පැමිණිලි අංකය : එච්.ආර්.සී/175/16

පැමිණිල්ල තුලින් දක්වා ඇති කරුණු :

පැමිණිලිකාරිය පැමිණිල්ල ගොනු කරන ලද අවස්ථාවේ වයස අවුරුදු 67ක් වයසැති සමෘද්ධි ලාභී අයෙකු බව ද එක් ඇසක් අන්ධ කාන්තාවක් බව ද පැමිණිල්ල තුලින් දක්වා ඇත. 1974 වසරේදී විවාහ වීමෙන් අනතුරුව පැමිණිලිකාරිය පැමිණිල්ලේ දක්වා ඇති හංවැල්ල, වග, වැලිකන්න, වැලිඹිවිට කන්ද, නො. 72/1 දරණ ස්ථානයේ පදිංචිව සිටින බව ද ස්වාමිපුරුෂයා ද තම දරුවා ද මියගිය පසු එම රජය සතු



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com

දේපලෙහි පදිංචිව සිටින ලද්දේ රජයේ ඉඩමක් වන තමා පදිංචි ඉහත ලිපිනයෙන් දක්වා ඇති එකී ඉඩමට අදාලව ඉල්ලුම් කළ පරිදි ඔප්පුවක් ලබාදෙන තුරු බව ප්‍රකාශ කර සිටී. ඔප්පු ලබාගැනීමට අදාලව පවත්වන ලද ඉඩම් පරීක්ෂණ සඳහා ද ඉදිරිපත්ව සිටි බව කියා සිටින අතර වගඋත්තරකරුවන් පැමිණ කහහේන ප්‍රදේශයේ පන්සලේ දී ඔප්පු ලබාදීමේ පරීක්ෂණ පවත්වන අවස්ථාවේ තමා ඉදිරිපත් වූ බව ද 2015 වසර වනතුරුත් පරීක්ෂණ තවදුරටත් පවත්වන බව දක්වමින් වගඋත්තරකරුවන් විසින් එම ඉඩමට ඔප්පුවක් ලබාදීම ප්‍රමාද කළ බව ප්‍රකාශ කර සිටී. වසර 30කට අධික කාලයක් වගඋත්තරකරුවන් විසින් තම ඉල්ලා සිටින සහනය ලබා නොදීමෙන් තම නිවසට විදුලිය ලබාගැනීමට ද නොහැකිව ලාම්පු තෙල් කුප්පියක ආධාරයෙන් රාත්‍රිය ගත කරන බව ද වැඩිදුරටත් දක්වා තිබේ. සමෘද්ධි ණය ආධාර ලබා දෙන්නේ ද ඉඩමේ ඇති ඔප්පුව පෙන්වා දුන් පසු බැවින් ඉඩම සංවර්ධනය කර වගා කටයුතු පවත්වාගෙන යාමේදී පැමිණිලිකාරියට ගැටළු පැනනැගී ඇති බව කියා සිටී. දැනට ද තහඩු සෙවිලි කළ නිවසක පදිංචිව සිටින්නේ ද නිවාස ආධාර ද ලබා ගැනීමට ඔප්පුවක් ලබා නොදුන් බැවින් ඊට අදාලව රජය වරින් වර ලබාදුන් එවැනි සහන ද අතහැරී ගොස් තව තවත් දිළිඳු බවට පත්ව ඇති බව පෙන්වා දෙන ලදි.

වගඋත්තරකරුවන් කැඳවා පරීක්ෂණයක් සිදු කර තම දේපලට අදාලව ඇති පදිංචිය සළකා බලා රජයේ ඔප්පුවක් මගින් හිමිකම ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර රජයේ ප්‍රදාන පත්‍රයක් හෝ ඔප්පුවක් ලබා දීමට අවශ්‍ය පියවර ද තම ඉල්ලීම නොසළකා හැරීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වූ බවට නිර්දේශයක් සහ වන්දි ද වැඩිදුරටත් ඉල්ලා සිටී.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :**

වගඋත්තරකාර සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙතින් ලිඛිතව වාර්තාවක් ලබාගැනීමට අදාලව 2016.05.06 දින කොමිෂන් සභාව විසින් දැන්වීම් නිකුත් කර ඇතත් 2016.06.06 වන දිනට නියමිත වාර්තාව ලබා දී නොමැති බැවින් තවදුරටත් වගඋත්තරකරුවන්ගේ කරුණු පරීක්ෂණයේදී ලබාගැනීමට තීරණය කරමින් සිතාසි ප්‍රකාරව පාර්ශවයන් කැඳවීමට තීරණය කරන ලදි. ඒ අනුව පරීක්ෂණයේදී අනාවරණය වන කරුණු තුලින් වගඋත්තරකරුවන්ගේ කරුණු වාර්තා කර ගැනීමට යටත්ව පරීක්ෂණ කටයුතු සිදු කරන ලදි.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු :**

2016.11.10 දින පරීක්ෂණ දිනයේදී වගඋත්තරකරු ලෙස පැමිණ සිටි ප්‍රාදේශීය ලේකම් විසින් මින් පෙර කොමිෂන් සභාව ඉල්ලා සිටි වාර්තාව ලබා දුන් බව ප්‍රකාශ කරන අතර එය ගොනුවට ලැබී නොතිබූ බැවින් වැඩිදුරටත් එකී වාර්තාවට අනුව ඉදිරිපත් කළයුතු කරුණු නැවතත් පහත පරිදි දක්වා සිටින ලදි.

පැමිණිලිකාරිය කියා සිටින දේපළට අදාළව දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලෙජර් සටහන් නොමැති බව ද බලපත්‍රයක පිටපතක් ද නොමැති බව පෙන්වා දෙන ලදි. සර්වේ ජනරාල් වරයා විසින් දේපළ මැන සකස් කරන අවස්ථාවක දී එහි පැමිණිලිකාරියගේ සහෝදරයෙකු වන ඇන්ටනි කුරේ නැමැති අය එම දේපළෙහි රැඳී සිට වගා කරමින් භුක්ති විදින බව සටහන් තබා දක්වා ඇති බව ප්‍රකාශ කරන අතර එදින පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකාරිය ඉදිරිපත්ව නොසිටීමේ හේතුව මත වැඩිදුර ඊට ආදළ කරුණු අනාවරණය කර ගැනීමට නොහැකි වේ. විවිධ රාජ්‍ය ආයතන ගණනාවක් වෙත පැමිණිලිකාරිය තම පැමිණිල්ල ඉදිරිපත් කරමින් කරුණු කියා පෑමට කටයුතු කර ඇති බව පෙනී යන අතර 1974 වසරේ සිට සලකා බැලීමේදී වසර 40කට වැඩි කාලයක් ගතවී තිබුණ ද මෙම ගැටළුව කිසිදු ආයතනයක් වෙතින් විසඳී නැති බව අනාවරණය වේ. ඒ අනුව බලපත්‍රයක් ලබාගැනීමට පැමිණිලිකාරියට හිමිකමක් තිබේද යන්න බැලීමේදී වෙනත් අයදුම්කරුවන්ට වඩා වැඩිමනක් පැමිණිලිකාරියට පවතින බැවින් ඊට මූලිකත්වය දී කටයුතු කල යුතුව තිබූ බව පෙන්වා දෙමි.

වගඋත්තරකරු කියා සිටින පරිදි මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් අදාළ මැනුම් කටයුතු සිදු කරන විට මෙම දේපළ සහ යාබද දේපළ වෙත අවධානය යොමු කිරීමේදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇති බව මිනින්දෝරු වාර්තා වලට අනුව සඳහන් වන බවක් ද අනාවරණය වේ. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ හා පළාත් ඉඩම් කොමසාරිස්ගේ තීරණයකට අනුව පැමිණිලිකාරිය ඉල්ලා සිටින සහනය ලබා දියහැකි බව ද එම ගොනු පරීක්ෂා කිරීමේදී තහවුරු වේ.

2017.03.31 දින පරීක්ෂණ අවස්ථාවේදී ඉඩම් කොමසාරිස් ජනරාල් කැඳවා කළ විමසීමේදී ඒ වෙනුවෙන් දක්වා ඇත්තේ බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් හරහා පරීක්ෂණය සිදු කිරීම වඩාත් සුදුසු බවය. එබැවින් නැවත අදාළ පාර්ශවයන් කැඳවා සියළු වගඋත්තරකරුවන් ඉදිරිපිට පරීක්ෂණය සිදු කළයුතු බව නිරීක්ෂණය වේ.

2017.05.22 දින තෙවන වරට පරීක්ෂණය සිදු කරන ලද අතර වගඋත්තරකරුවන් එහිදී දක්වා ඇත්තේ එතෙක් එම දේපළට අදාළව ඇන්තනි කුරේ යන අයෙකුගේ නම සඳහන්ව ඇති බැවින් එවැනි අයෙකු ඉදිරිපත්ව ඇත්ද යන්න සොයා බැලීම සුදුසු බවයි. එසේ ඉදිරිපත් වීමක් නොමැති නම් තවදුරටත් මෙම දේපළ රජයේ දේපළක් ලෙස සලකා පැමිණිලිකාරියගේ ඉල්ලීමට අදාළව බලපත්‍රයක් ලබාදීමට අවශ්‍ය පියවර ගතයුතු ය. එහිදී පැමිණිලිකාරිය කියා සිටින්නේ, ඇන්තනි කුරේ යන අය ද සහභාගී කරවාගෙන තමා එම ඉඩමේ පදිංචි බව පිළිගන්වන දිවුරුම් ප්‍රකාශයක් ද රැගෙන බදාදා දිනක වගඋත්තරකරුවන් වෙත ඉදිරිපත් වීමට කැමති බවය.

මෙම දේපළ ඉහත පරිදි පරීක්ෂණ කටයුතු සිදුකළ පසු කරුණු තහවුරු වේ නම් කඩිනමින් ඉඩම් කච්චේරියක් පවත්වා පැමිණිලිකාරිය කැඳවා ඇයට බලපත්‍රය ලබාදීමට අවශ්‍ය පියවර ගෙන, විරෝධතා තිබේනම් ඊට අවස්ථාවක් ලබාදීම සුදුසු බව වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කරන ලදි. පැමිණිලිකාරිය දීර්ඝ කාලයක් මෙම සහනය ඉල්ලා බොහෝ අවස්ථා ගණනාවක් පුරා දැඩි වෙහෙසක් ගෙන කටයුතු කර ඇති බව පෙනී යන හෙයින් තවදුරටත් වගඋත්තරකරුවන් කටයුතු කිරීමේදී දීර්ඝ කාලයක් නොගෙන අදාළ සහනය ලබාදීමට පියවර ගන්නා ලෙස ද දන්වා ඇත.

2017.12.11 දින අවසන් පරීක්ෂණය සිදු කරන ලදි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද දැනුම්දීම් අනුව පැමිණිලිකාරිය හට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක: 2013/01 හි විධිවිධාන යටතේ පවතින තේ වගාව සහිත අක්කර 1/2ක කොටස ලබාදීමට වගඋත්තරකරුවන් එකඟ වුවද පැමිණිලිකාරිය කියා සිටින්නේ සහන ඉල්ලා නොමැති සහ දේපළ භුක්ති විඳ නොමැති පාර්ශවයකට තම ඉඩම බෙදා කොටස් ලබා දීමට තම විරෝධතාවය පළ කරන බවත් එම ප්‍රදේශයේ පදිංචිකරුවන් නොවන පාර්ශවයන් දෙදෙනෙකු හට තමා භුක්ති විඳි ඉඩම දෙකට බෙදා කොටසක් ලබා දීමට තම විරෝධතාවය පළ කරන බවත් ය. වගඋත්තරකරුවන් ඒ අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශයක් මත ඉදිරි පියවර ගන්නා බව දක්වා සිටී. වැඩිදුරටත් වගඋත්තරකරුවන් කියා සිටින්නේ, ඉඩම් ඉල්ලුම් කර ඇති වෙනත් පාර්ශවයන් පුද්ගලික ඉඩම් තිබෙන අය වේ නම් ඔවුන්ට රජයේ ඉඩම් ලබාදීමට අවශ්‍යතාවයක් නොපෙනෙන බවත් රජයේ ඉඩම් ප්‍රතිපත්තිවලට අනුව එසේ ඉඩම් ලබාදීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරනු ලබන ලිඛිත දැනුම්දීමකට අනුව කටයුතු කිරීමට හැකි බවත් ය.

**නිරීක්ෂණ හා නිගමන :**

පැමිණිලිකාරිය සහ වගඋත්තරකරුවන් පරීක්ෂණ අවස්ථාවලදී ඉදිරිපත් කළ කරුණු ද දෙපාර්ශවයේ ලේඛනමය වාර්තා ද පැමිණිල්ලට අදාළව ඇති කරුණු හා ඉල්ලා ඇති සහනය වෙත ද අවධානය යොමු කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය වේ.

2015.05.07 දින ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් තම අංක : 3/4/1/බ.ප./කොළඹ/II යටතේ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත දක්වා ඇත්තේ, ඉඩම් අමාත්‍යතුමා වෙත පැමිණිලිකාරිය විසින් ඉල්ලා ඇති ඉල්ලීමක් ඇති බැවින් (එහි පිටපතක් ද යොමු කර) කඩිනමින් පැමිණිලිකාරියගේ ඉල්ලීම ඉටු කිරීමට ගන්නා ලද පියවර පිළිබඳ ඔහුට වාර්තා කරන ලෙස බව නිරීක්ෂණය වේ.

2015.06.22 දින හංවැල්ල ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉහත ලිපියට අනුව දක්වා ඇත්තේ, වැලිකන්න ග්‍රාම නිලධාරී වසමේ මූ.පි.කො.5956 හි කැබලි අංක 23 දරණ ඉඩමට අදාළව බලපත්‍ර ලබාදෙන ලෙස පැමිණිලිකාරිය සහ ඇගේ සොයුරා විසින් ඉල්ලීමක් කර ඇති බව ද මෙම ඉඩම් කොටස් සඳහා ඉඩම් කච්චේරියක් පවත්වා පරීක්ෂා කර බලා පැමිණිලිකාරිය පර්චස් 80ක බිම් කොටසක් වෙනුවෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍රයක් ලබාදීමටත්, පර්චස් 83ක් සඳහා ඇන්ටනි යන අයට දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් ලබාදීමටත් නිර්දේශ වී ඇති බව ය.

තවද පැමිණිලිකාරියගේ සොයුරියක වන මරිය තෙරේසා කුරේ යන අය ද ඉඩම් කොටසක් ඉල්ලා ඉහත ඉල්ලුම්කරුවන්ට එරෙහිව විරෝධතා ඉදිරිපත් කළ බැවින් ඇන්ටනි කුරේ තමාට වෙන්වූ දීර්ඝ කාලීන බදු පදනම මත ලැබෙන ඉඩම් කොටසෙන් අඩක් මරිය තෙරේසා කුරේට ලබාදීමට එකඟ වී ඇති බව ප්‍රාදේශීය ලේකම් දක්වා තිබේ. මෙහිදී ප්‍රාදේශීය ලේකම් 2015.09.05 දින තම අංක 03/03/බිම්/ඉ.ක./05 යටතේ පළාත් ඉඩම් කොමසාරිස් වෙත නැවත දක්වා ඇත්තේ කැබලි අංක 23 දරණ ඉඩම පැමිණිලිකාරියට සහ ඇන්ටනි කුරේ යන අයට ලබා දීමට 2013.08.12 දින පැවැත්වූ ඉඩම් කච්චේරියේදී තේරීම් ලැබූ බව ද ඊට පාර්ශවයන් එකඟ වූ බව ද ය. ඇන්ටනි කුරේ යන අයට බලපත්‍රයක් මුලින් නිකුත් වී තිබුණේද යන්න

තහවුරු වී නැති බව ද අදාල මැනුම් සිදු කල පිඹුරුපත් වල පමණක් ඇන්ටනි කුරේ යන අයට බලපත්‍රයක් සහිත ඉඩම් කොටසක් ඇති බව සඳහනක් පමණක් ඇති බවය.

2017 ජනවාරි 20 දින සීතාවක ප්‍රාදේශීය ලේකම්. හට ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දන්වා ඇත්තේ පැමිණිලිකාරිය ඉල්ලා සිටින ඉඩමට බලපත්‍රයක් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙසටය. නමුත් 2015.06.05 දින ප්‍රාදේශීය ලේකම් විසින් තම අංක : 03/03/බිම්/ඉ.ක/05 යටතේ වැඩිදුරටත් පළාත් ඉඩම් කොමසාරිස් (බ.ප.) වෙත දක්වා ඇත්තේ, මෙම ඉඩම බැහැර කිරීම සම්බන්ධව පැන නැගී ඇති ගැටළුකාරී තත්ත්වය මත අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙසය.

තවද 2017.03.22 දින සීතාවක ප්‍රාදේශීය ලේකම් විසින් තම අංක : 3/3/බිම්/ඉ.ක./05 යටතේ ජනාධිපති ලේකම් වෙත ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කරන ලද විමසීමට අනුව පිළිතුරු වශයෙන් කරුණු දක්වමින් කියා සිටින්නේ පැමිණිලිකාරිය 2012.11.14 දින තමා භුක්ති විදිනු ලබන මූ.පි.කො. 5956 පිඹුරේ කැබලි අංක 23 සඳහා බලපත්‍රයක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති බව ද එම පිඹුරේ කැබලි විස්තරයේ එම ඉඩම් කොටස ඇගේ සොයුරෙකු වන ඇන්ටනි කුරේ නමින් බලපත්‍රයක් නිකුත් කළ බවට සටහනක් ඇති බවටය. තවද බිම් සවිය වැඩසටහන යටතේ බලපත්‍ර ලබාදීම සඳහා 2013.08.12 දින පවත්වනු ලබන ඉඩම් කච්චේරියට පැමිණිලිකාරිය සහ ඇන්ටනි කුරේ යන දෙදෙනාම ඉදිරිපත් වූ බව ද මෙම පැමිණිලිකාරියට අක්කර 01යි පර්චස් 03ක් වන මුළු ඉඩමෙන් පර්චස් 80ක් ලබාදීමට ද ඇයගේ සොයුරා වන ඇන්ටනි කුරේ යන අයට පර්චස් 80ක් ද ලබාදීමට ද සුදුසු බව තීරණය වූ බවය. නමුත් විරෝධතා කැඳවීමේදී තමා භුක්ති විදින ඉඩමෙන් කොටසක් ඇන්ටනි කුරේ වෙත පැවරීමට පැමිණිලිකාරිය අකමැත්ත පල කළ බැවින් විරෝධතා පරීක්ෂණයක් පවත්වා ඇති බව ද පෙන්වා දී තිබේ. මෙම පැමිණිලිකාරියගේ සොයුරියක වන මරිය තෙරේසා කුරේ යන අය ද මෙම ඉඩමෙන් කොටසක් පසු කාලීනව ඉල්ලා ඇති අතර ඒ සඳහා ඇන්ටනි කුරේ යන අයට ලබාදීමට නිර්දේශිත පර්චස් 83න් පර්චස් 41.5ක් මරිය තෙරේසා කුරේ යන අයට ලබාදීමට පාර්ශවයන් එකගතාවය පල කළ බව ද දක්වා තිබේ. නමුත් ඇන්ටනි කුරේ නමින් බලපත්‍රයක් නිකුත් කළ බව කැබලි විස්තර ලැයිස්තුවේ සඳහන්ව තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලෙජර් සටහන් පොත්පත්වල එවැනි බලපත්‍රයක් නිකුත් කළ බවට සටහනක් කාර්යාලීය තොරතුරු තුළ නොමැති බැවින් පෙන්වා දී තිබේ. ඉඩම් කච්චේරියට ඉදිරිපත්ව නොසිටි අයෙකුට ඉඩම් කොටසක් ලබාදීම ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව කෙසේ සිදු කරන්නේද යන්න පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් ප්‍රාදේශීය ලේකම් විමසා ඇති බව ද එම ලිපියෙන්ම පැහැදිලි වේ.

පළාත් ඉඩම් කොමසාරිස් (බ.ප.) විසින් 2017.06.15 දින තම අංක : පළාත් ඉ.කො./ඉ.08/හංවැල්ල/92 තුළින් ප්‍රාදේශීය ලේකම්. සීතාවක (හංවැල්ල) වෙත කියා ඇත්තේ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක : 2008/04 අනුව ඉඩම් කච්චේරිය පවත්වා පියවර ගෙන ඔහු වෙත වාර්තාවක් ලබාදෙන ලෙස ය.

2017.08.27 දින තම අංක : පළාත් ඉ.කො./ඉ.08/හංවැල්ල/92 යටතේ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් පළාත් ඉඩම් කොමසාරිස් දක්වා සිටින්නේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් කච්චේරිය පවත්වා සියළු පාර්ශවයන් කැඳවා එනම්, මෙම පැමිණිලිකාරිය වන තෙරේසා කුරේ මහත්මිය ද මරිය කුරේ මහත්මිය ද ඇන්ටනි කුරේ මහතා ද කැඳවා ලබාගන්නා ලද ප්‍රකාශ අනුව ලද තොරතුරු කොළඹ දිස්ත්‍රික් මූලස්ථාන ඉඩම් නිලධාරී මහතා මගින් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ලබාගෙන ඇති බව ද මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන තෙරේසා කුරේ යන අය

තමා භුක්ති විඳි සම්පූර්ණ ඉඩම තමා වෙත ලබාදෙන ලෙස ඉල්ලා ඇති බව ද ඉතිරි දෙදෙනා ද ඔවුන් ඉහත කාලවල ඉඩමේ පදිංචිව සිටි බැවින් ඉඩම් කොටස් ඔවුන් වෙත ලබාදීමට කටයුතු කරන ලෙස ද ඉල්ලීමක් කර ඇති බව ය.

1982 වසරේ මෙම ඉඩම මැන මූ.පි.කො. 5956 නම් පිඹුරේ කැබලි අංක 23ට අදාලව ඇන්ටනි කුරේ යන අය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ අවසර පත්‍රයක් මත වගා කර ඇති බව කියා සිටිය ද බලපත්‍ර අංකය එහි සඳහන් කර නැති අතර එවැනි අවසර පත්‍රයක් ලබාදුන් බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලෙජර් සටහන් පොත්වල සඳහනක් නොමැති බව ද ඇන්ටනි කුරේ සතුව බලපත්‍රයක් නොමැති බව ද පෙනී යන අතර එම අවසර පත්‍රය ඉඩමේ තිබූ ගෙය සමග විනාශ වී ඇති බවට පමණක් ඇන්ටනි කුරේ ප්‍රකාශ කරන බව ද පෙන්වා දී තිබෙන බව නිරීක්ෂණය වේ. පසුව කරුණු තහවුරු කර ගැනීමට වසමේ ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරී ද සමග කොළඹ දිස්ත්‍රික් මූලස්ථාන ඉඩම් නිලධාරී ද සමග එක්ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇති බව ද අනාවරණය වේ. ක්ෂේත්‍ර පරීක්ෂණයේදී පෙනී ගොස් ඇත්තේ ටෙරේසා කුරේ මහත්මිය හෙවත් මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය හා ඇගේ ස්වාමිපුරුෂයා මෙම ඉඩමේ තේ පැළ 1300ක් පමණ වගා කර ඇති බව හා ඉඩමට නිතර යන එන බව දක්වා තිබුණද ඉඩමේ පර්චස් 60ක පමණ කොටසක නඩත්තු නොකළ තේ වගාවක් ඇති බව ද කඩාවැටුණු නිවසක අත්තිවාරමක් ඇති බව ද මුළු ඉඩමම වල් බිහි වී ඇති බව ද වාර්තා කර ඇති බවය. තේ වගාව සහිත ඉඩම නඩත්තු නොකළ බව ද පැමිණිලිකාරිය මෙම ඉඩම භුක්ති විඳීමක් නොකරන බව ද ඉතිරි පාර්ශවයන් ද වරින් වර ඉඩමට ගොස් ඇති බව නිරීක්ෂණය වන බව ක්ෂේත්‍ර පරීක්ෂකගේ අදහස වේ. පලාත් ඉඩම් කොමසාරිස්ගේ අදහස වී ඇත්තේ තේ වගාව සහිත අක්කර 1/2ක කොටස පැමිණිලිකාරිය ලබාදීමට සුදුසු බව ද ඉතිරි බිම් ප්‍රමාණය සමානව ඇන්ටනි කුරේ සහ මරිය කුරේ යන අයට ද සුදුසු බවට ද නැතිනම් ඉඩම් නොමැති වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම සුදුසු බවය. තවද සීතාවක ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කච්චේරියට අදාළ අවසන් තේරීම් ලැයිස්තුව ප්‍රසිද්ධ කර නොමැති බැවින් මානව හිමිකම් කොමිෂන් සභාවේ උපදෙස් වලින් අනතුරුව අවසන් තේරීම් ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමට පියවර ගන්නා බවටද කරුණු දක්වා තිබේ.

ලද තොරතුරු අනුව පෙනී යන්නේ තෙරේසා කුරේ එනම්, මෙම පැමිණිලිකාරිය ඉඩම් කච්චේරිය පවත්වා ඇති ආකාරය හා ක්ෂේත්‍ර පරීක්ෂණය සම්බන්ධව ද එකඟ නොවන අතර විරෝධතා සලකා බලා ඇති ආකාරය පිළිබඳව ද තමාට එකඟ විය නොහැකි බැවින් මානව හිමිකම් කොමිෂන් සභාවේ තමා ගොනු කළ පැමිණිල්ල තුළින් සාධාරණ සහනයක් බලාපොරොත්තු වන බවය.

1974 වසරේ සිට පැමිණිලිකාර තමා මෙම දේපළ තුළ පදිංචි බව ද තමාගේ සහෝදරයින් දෙදෙනෙකු මෙම පලාතේ පදිංචිව නොසිටියදී ඉඩම් කච්චේරියට කැඳවා පක්ෂපාතීව කටයුතු කරමින් වගඋත්තරකරුවන් විසින් තමා භුක්ති විඳින ඉඩමෙන් කොටස් ඔවුන් වෙත ලබාදීමට පියවර ගැනීමට ද පැමිණිලිකාරිය විරුද්ධ බව දක්වා තිබීම ද නිරීක්ෂණය වන වැදගත් කාරණාවකි. ඉඩම් කච්චේරියක් මින් පෙර පවත්වා නොතිබුණු බව ද මෙම ගැටළුව මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පසු කොමිෂන් සභාවේ ඉල්ලීම් වලට අනුව ඉඩම් කච්චේරියක් පවත්වා පසුව කිසිදු ආකාරයකට මෙම පැමිණිලිකාරියගේ දේපළ පිහිටි ගමට සම්බන්ධතාවයක් නොමැති තමාගේ සහෝදරයෙකු සහ සහෝදරියක ඉඩම් කච්චේරියට කැඳවා ගනිමින් සහන ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව පැමිණිලිකාරිය විරුද්ධ බව පෙනී යයි. තමාට අසාධාරණ ලෙස කටයුතු කළ නිලධාරීන් මෙම ඉඩම් පරීක්ෂණ වලට

සහභාගී වීම තුළින් තමාට සහනයක් නොලැබෙන බව තමා දැනසිටි බව 2017.07.23 වන දින පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාවට ලිඛිතව දක්වා තිබීමෙන් පෙනී යන්නේ තවදුරටත් කොමිෂන් සභාවේ මැදිහත්වීම මත ලබාදෙන තීරණය පිළිබඳව විශ්වාසයක් තබා ඇති බවය. තම මවගේ හෝ පියාගේ උරුමයෙන් ලද ඉඩමක් නම් සහෝදරයින් ඉල්ලා සිටින අයිතිවාසිකම් පිළිබඳව තමාට එකඟ වියහැකි වුවද වෙනත් ප්‍රදේශ වල පදිංචි බවට ග්‍රාම නිලධාරී වරුන් විසින් ද තහවුරු කර හා සිටියදී හා සමෘද්ධි සහනාධාර ද වෙනත් ප්‍රදේශවල පදිංචිව සිට ලබාගත් බවට ඔප්පු කිරීමට අදාළව ලේඛන ඉදිරිපත්ව තිබියදී තමා වසර ගණනාවක සිට පදිංචි දේපළට බලපත්‍රයක් ලබාගැනීමට ඔවුන් ඉදිරිපත්වීම පිළිබඳ පැමිණිලිකාරිය තම විරෝධතාවය පළ කර සිටී. 1974 වසරේ සිට ඉඩමේ පදිංචිකාරියක් බවට තම විවාහයෙන් පසුව කළුඅග්ගල දෙව්මැදුරේ කතෝලික පූජකතුමා විසින් ලබාදුන් පවුල් පොතේ සඳහන් උපුටනයක් ද සමෘද්ධි බැංකු සංගමය විසින් වැලිකන්ත. වැලිඔවිට කන්ද ඉඩමේ පැමිණිලිකාරියගේ පදිංචිය ඇති බවට සඳහන් කළ ලේඛනය ද වැලිකන්ත දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ කළමණාකරු විසින් ඉහත දේපළේ පැමිණිලිකාරිය පදිංචි බව ද තේ පැළ 1300ක් ද මෙම ඉඩමේ වගා කිරීම සඳහා නිකුත් කළ බවට දක්වා ඇති අතර දිවිනැගුම අමාත්‍යාංශය විසින් පැමිණිලිකාරිය ගෘහ ආර්ථික ඒකකයේ පවුලක් බවට නිකුත් කළ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා ලෙස හිටපු බැසිල් රාජපක්ෂ මහතා විසින් අත්සන් තබන ලද ලේඛනයේ පිටපතක් ද අමුණා ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. තම විවාහ සහතිකය ද පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති අතර එහි ද ලිපිනය පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ වැලිකන්ත. වග යන ලිපිනය පැමිණිලිකාරිය හා ස්වාමිපුරුෂයා යන දෙදෙනාම තම ලිපිනය ලෙස නිවැරදිව දක්වා ඇති බව ය.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් 2007.08.20 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 2008/04 අනුව සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරු හා සහකාර ඉඩම් කොමසාරිස්වරුන් දක්වා ඇත්තේ රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පාලනය කිරීම සහ කළමණාකරණය විධිමත් කිරීම සඳහා කටයුතු කළයුතු ආකාරය පිළිබඳවය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ සැබෑ ඉඩම් නොමැති තැනැත්තන් හදුනා ගැනීමට නීති මගින් පෙන්වා දී ඇති පරිදි විනිවිද භාවයකින් යුතුව තෝරා ගැනීමේ ක්‍රමයක් සැකසීම ද සංවිධානාත්මකව හෝ පෞද්ගලිකව රජයේ ඉඩම් අල්ලා ගැනීම වළක්වා ගැනීම මෙම චක්‍රලේඛයේ අරමුණක් බව ද දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ සැබෑ ඉඩම් නොමැති තැනැත්තන් හදුනා ගැනීම සඳහා ද රජයේ ඉඩමක් ලබාගැනීම සඳහා සුදුසු තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා ද එම ලේඛනය යාවත්කාලීන කිරීමට අදාල පියවර පිළිබඳව ද ඉහත කී චක්‍රලේඛය තුළින් මෙන්ම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පනවා ඇති නියෝග තුළින් ද පැහැදිලිව දක්වා තිබේ. පැමිණිලිකාරිය ඒ අනුව එකී ලියාපදිංචිය සඳහා 2017.06.24 දින තම අයදුම්පත්‍රය පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බව ද පැමිණිලිකාරියගේ ලේඛන පරීක්ෂා කිරීමේදී සනාථ වන අතර එහි පිටපතක් මෙම පැමිණිල්ලේ ගොනුවේ ද අමුණා ඉදිරිපත් කර තිබේ. ඉඩම් කච්චේරියක් මත පමණක් තෝරා ගැනීම සිදු කළයුතු බව ද දක්වා ඇති අතර රජයේ ඉඩම් ලබාගැනීමට සුදුසු තැනැත්තන් ලියාපදිංචි කළ ලේඛනයේ නම් සඳහන් අය වෙතින් පමණක් කච්චේරියට කැඳවිය යුතු බවට ද සඳහන්ව තිබේ.

පැමිණිලිකාරිය විසින් 1974 වසරේ සිට මෙම විෂයගත ඉඩම භුක්ති විඳිමින් බලපත්‍රයක් ලබාගැනීම සඳහා විවිධ ඉල්ලීම් දීර්ඝ කාලයක් පුරා ඉදිරිපත් කළ අයෙකු බව පෙනී යයි. වර්තමානය වන විට නිකුත්ව ඇති

ඉඩම් බෙදා දීමට අදාලව නිකුත් කළ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ සහ ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව නිකුත් කළ නියෝග ද සළකා බැලීමේදී පෙනී යන්නේ පැමිණිලිකාරිය වසර 40කට පෙර කරන ලද ඉල්ලීම් අනුව සුදුසු අවස්ථාවේ කටයුතු කරන ලද්දේ නම් පසු කාලීනව නිකුත් කළ චක්‍රලේඛ සහ නියෝග වල සඳහන් කොන්දේසි පැමිණිලිකාරියට මෙම විෂය ගත දේපලට අදාළ බලපත්‍රයක් ලබාගැනීමේදී හරස් බලපෑමක් නොකරන බවය. තේ පැල 1300ක් ලබාගත් බවට ඉදිරිපත් කළ සහතික ද පැහැදිලිව ඇති බව පෙනී යන අතර ඒවා එම දේපලෙහි සිටුවා ඇති බව ද පාර්ශවයන් ඉදිරිපත් කරන කරුණු අනුව තහවුරු වේ. එහෙත් එකී වගාව සංවර්ධනය කිරීමට සමෘද්ධි ආධාර යටතේ ලබාදෙන ණය ආධාර ලබාගැනීමට පැමිණිලිකාරියට නොහැකි වී ඇත්තේ නිත්‍යානුකූල ඔප්පුවක් දේපලට අදාලව ලබා දී නොතිබීම මත බව පෙනී යයි. ජලය හා විදුලිය වැනි පහසුකම් ද නොමැති නිසා පැමිණිලිකාරිය ගැටළු සහගත තත්ත්වයකට මුහුණ දී තිබුණු බව ද පෙනී යයි. ඇන්ටනි කුරේ මෙම දේපලෙන් කොටසක් ඉල්ලා සිටින පාර්ශවයක් වුවද 2014.05.23 දින නිකුත් කරන ලද ඔහුගේ ජාතික හැඳුනුම්පත පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ ඔහුගේ ලිපිනය මඩපාත, මාකන්දන ප්‍රදේශයේ පදිංචිය ඇති බවට ඉන් තහවුරු වන බවය.

තවද මරියා තෙරේෂා යන අයගේ පදිංචිය ද මෙම ග්‍රාම නිලධාරී වසමට අදාළ එකක් නොවන බවට ද පැමිණිලිකාරිය කරුණු දක්වා තිබේ. ඒ අනුව පැමිණිලිකාරිය තම ඉල්ලීම සිදු කරන්නේ අක්කරයක පමණ ඉඩමකට වන අතර ඉඩම් කච්චේරියක් පවත්වා අක්කර 1/2ක ප්‍රමාණයක් එනම්, මෙම තේ පැල වගා කළ ප්‍රමාණයට අදාළ බිම් ප්‍රමාණය පමණක් පැමිණිලිකාරියට ලබාදීමට වගඋත්තරකරුවන් කැමැත්ත පල කර මෙම ග්‍රාම නිලධාරී වසමේ හෝ ප්‍රාදේශීය ලේකම් වසමේ හෝ පදිංචි නොමැති ඉතිරි දෙපාර්ශවය සඳහා පැමිණිලිකාරිය ඉල්ලා සිටින ඉඩමෙන් 1/2ක් බෙදා වෙන් කර දීමට කටයුතු කිරීම ඉඩම් සංවර්ධනය කිරීමේ ආඥා පනතට හා ඊට යටත්ව නිකුත් කළ නියෝග වලට අනුව සාධාරණ හා නිත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය වේ. එමෙන්ම පැමිණිලිකාරිය මෙම දේපළ ඇයට හැකි ආකාරයට භුක්ති විඳි අයෙකු බව ද පෙනී යන්නේ තේ පැල 1300ක් පමණ සිටුවා ඇති බව ද පෙනී යාමෙනි. මෙම දේපළ භුක්ති විඳිමින් කටයුතු කළ බව තහවුරු කිරීමට පැමිණිලිකාරිය ඉදිරිපත් කළ ලේඛන වල ප්‍රමාණයට අනුව සළකා බැලීමේදී ඉඩමේ කොටස් ඉල්ලා සිටින අනෙක් පාර්ශවයන් එවැනි භුක්තියක් හෝ වැලිකන්න, වග නැමැති ලිපිනයට අදාලව එම වෙනත් පාර්ශවයන්ගේ පදිංචිය තහවුරු කරවන වෙනත් කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති බව පෙනී යයි. 1974 වසරේ සිට පැමිණිලිකාරිය මෙම දේපළ තුළ භුක්ති විඳිමින් බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලීම් කර ඇති අතර වර්තමානය වන විට විවිධ චක්‍රලේඛ හා නියෝග මත ඉඩම් බෙදාදීමේ ප්‍රමාණ පිළිබඳ තීරණ ගෙන තිබුණ ද පැමිණිලිකාරිය දේපලේ වගා කටයුතු කරමින් 1974 වසරේ සිට බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලීම් සිදු කළ කාලය හා සම්බන්ධව සළකා බැලීමේදී මෙම දේපලේ අක්කරයක පමණ ප්‍රමාණයක් ඇයට ලබාගැනීමට පසු කාලීන නීතිරීති නියෝග සළකා බලා සීමාවන් පැනවිය නොයුතු බව පෙන්වා දියයුතු ය. පැමිණිලිකාරියට මෙම අක්කරයක පමණ ප්‍රමාණය ලබාගැනීමට බාධාවක්ව පවතින්නේ 1974 වසරේ සිට හෝ ඊට ආසන්න කාලයක සිට පැමිණිලිකාරිය සිදු කළ ඉල්ලීම් අනුව වගඋත්තරකරුවන් නිසි කලට කළයුතු කාර්යභාරය සිදු නොකර තිබීම බව නිරීක්ෂණය වේ. පැමිණිලිකාරිය තේ පැල 1300ක ප්‍රමාණයක් වගා කර තිබෙන්නේ ඇය විසින් තේ වගාවක් ඇති කර එය වැඩිදියුණු කර ගැනීමේ අවශ්‍යතාවයක් මත වන අතර වල් බිහිව යාමට ඉඩ හැරීමට තේ වගාවක් කිරීමේ චේතනාත්මකව නොවන බව පෙන්වා දියයුතුය. වගඋත්තරකරුවන් ද තම ලේඛන තුළින් පැමිණිලිකාරියගේ තේ වගාව තිබූ බව පිළිගෙන තිබේ. එම තේ වගාව තුළින් ඉඩම

සංවර්ධනය කිරීමට පැමිණිලිකාරියට බාධාවක් වී තිබී ඇත්තේ ද ඔප්පුවක් ඉඩමට ලබාදී නොතිබීම මත බව ද පෙනී යන අතර පැමිණිලිකාරිය එම දේපල තුල තම පදිංචිය හා භුක්තිය තිබූ බව තහවුරු කර ඇති අතර විදුලිය හා ජලය වැනි මූලික අවශ්‍යතා නොතිබීමේ හේතුව මත දේපලේ පදිංචි වීමට නොහැකි තත්ත්වයත් උද්ගතව තිබුණද මෙම දේපලට අදාල ලිපිනය තුල පැමිණිලිකාරිය පදිංචිව සිටි බවට තහවුරු වන ලේඛන ගණනාවක් පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර තිබෙන බව තහවුරු වේ. දේපලේ පදිංචිව සිටිමින් වගාව වැඩිදියුණු කර ගැනීමට ද ඉඩම සංවර්ධනය කර ගැනීමට ද දුෂ්කර ජීවිතයක් ගත කරමින් පැමිණිලිකාරිය ක්‍රියා කර ඇත්තේ ජලය විදුලිය, ණය ආධාර හෝ නොමැතිව දරිද්‍රතාවයෙන් ජීවත් වෙමිනි. එබැවින් පැමිණිලිකාරිය ඔප්පුවක් ලබාදෙන ලෙසට ඉල්ලීම් කල මුල් ඉල්ලීම ඉදිරිපත් කල වර්ෂ සලකා බලා කටයුතු කිරීමද සාධාරණ හා යුක්ති සහගත බව නිරීක්ෂණය වේ. එබැවින් මෙම දේපලට අදාල ග්‍රාම නිලධාරී වසමේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වසමේ පදිංචි නොවන හා ඉඩම් නොමැති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රයක් හෝ ඉදිරිපත් කර නොමැති වෙනත් පාර්ශවයන් කැඳවා පැමිණිලිකාරිය ඉල්ලා සිටින දේපලම කොටස් කර ලබාදීමට කටයුතු කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව ද නීත්‍යානුකූල නොවන බව ද නිරීක්ෂණය වන බව පෙන්වා දෙමි. එය පැමිණිලිකාරිය මානසික හිංසනයකට පත් කරන අවස්ථාවක් බව ද නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :

පැමිණිලිකාරිය 1974 වසරේ සිට හෝ ආසන්න කාලයක සිට එනම්, වසර 46ක පමණ සිට ඔප්පුවක් ලබා දෙන ලෙස විවිධ ඉල්ලීම් කර ඇති බැවින් ද දේපළෙහි වගා කටයුත්තක් ලෙස තේ වගාව සහ අඹ හා කජු වගාවන් ද කර මෙම ඉඩම සංවර්ධනය කර භාවිතා කල අයෙකු බැවින් ද ඉඩම් සංවර්ධන ආඥා පනතේ ප්‍රතිපාදන හා ඊට යටත්ව නිකුත් කළ නියෝග ද ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ වලට ද අනුව පැමිණිලිකාරිය දේපලට අදාල ඔප්පුවක් ලබා දීමට හැකියාව තිබියදී එය නියමිත දිනට නිකුත් නොකිරීමෙන් හා නොසලකා හැර තිබීමෙන් මූලික අයිතිවාසිකම් කඩවන පරිදි වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ. ඉඩම සංවර්ධන කර ගැනීමට හා වගා කටයුතු සිදු කර ගැනීමට නොහැකි වන පරිදි ද ණය හා ආධාර ලබාගැනීමට ඇති අවස්ථාවන් අහිමි වීම ද වගඋත්තරකරුවන්ගේ මෙම නොසලකා හැරීම හේතුවක් වී ඇති බවද දක්වමින් මෙම පැමිණිලිකාරියට ජලය, විදුලිය වැනි මූලික අවශ්‍යතා පවා සපුරාගත නොහැකි තත්ත්වයක් ඉන් ඇති කර තිබෙන බවද වෙනත් බලපත්‍ර ඉල්ලුම්කරුවන්, සහ ප්‍රදානපත්‍ර ඉල්ලුම්කරුවන්ට සුදුසු කල එකී සහන ලබාදී පැමිණිලිකාරියට වෙනස්කොට සැලකීමෙන් කටයුතු කර ඇති බවද එය පැමිණිලිකාරිය මානසික හිංසනයට ලක්වීමටද හේතුවක් වී ඇති බවටද නිර්දේශ කරමින් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය වන පරිදි වගඋත්තරකරුවන් කටයුතු කරමින් මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තීන්හි පිළිගැනීම් උල්ලංඝනය කිරීමක් බව පෙන්වා දෙමු. පැමිණිලිකාරිය ඔප්පුවක් ඉල්ලා සිටි මුල් අවස්ථාවේ පැමිණිලිකාරියට ප්‍රදාන පත්‍රයක් ලබාදීමට කටයුතු නොකිරීමෙන් එකී දේපල සංවර්ධනය කර ගැනීමට දැඩි බාධාවක් ඇති වීමෙන් පැමිණිලිකාරියට ආර්ථික හානි සිදුව ඇතත් පැමිණිලිකාරිය ඉල්ලා ඇති වන්දි ප්‍රදානය කිරීමකින් තොරව පැමිණිලිකාරිය ඉල්ලා සිටින දේපලට අදාල මූ.පි.කො. 5956 පිඹුරේ කැබලි අංක

23 දරණ බිම් කොටසට අදාළ ඔප්පුව හෝ ප්‍රදාන පත්‍රය පැමිණිලිකාරියගේ නමට ලබාදීමට වගඋත්තරකරුවන් කටයුතු කළයුතු බව ද මින් නිර්දේශ කරනු ලැබේ.

2022.07.06 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මින් නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණි මාරසිංහ,
හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු/සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ද්/- ඩීd/-

විනිසුරු රෝහිණි මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka